නිවැසියන්ට උපදෙස්

# මදුරු මර්ධන වැඩපිළිවෙල

## අරමුණ

1. නිවසේ සහ පරිසරයේ *Aedes albopictus,* මදුරුවා පැතිරීම වලකාලීමට සහ පාලනය කිරීමට පහත තොරතුරු සපයනු ලැබේ.

## මදුරු උවදුර

2. මදුරුවන් මිනිසාට විශාල හිරිහැරයකි. සමහර මදුරු වර්ග මහජන සෞඛ්‍යයට තර්ජනයක් වන අතර අධික උණ, හිසරදය, ලප දැමීම, සන්ධි සහ මාංශ පේශි රිදීම වැනි ලක්ෂණ ඇති, මදුරුවා ගෙන් බෝවන බරපතල රෝගයක් වන ඩෙංගු උණ සාදයි. *Aedes albopictus,* මදුරුවා ගෙන් පැතිරෙන ඩෙංගු උණ සහ ඩෙංගු රක්තපාතික උණ හොංකොංහි බහුලව ඇත. එම මදුරුවා ගම්බදව සහ නාගරිකව පැතිරෙන අතර කෘත්‍රිම ස්ථාන වල එනම් භාජන, පරණ ටයර්, පෙට්ටි, ටින් ආදියේත්, ස්වාභාවික ස්ථාන ලෙස ගස්බෙන, කපා ඉතිරි වූ උන බම්බු කොටස්, කොලු නටුවට සම්බන්ධ වන ස්ථාන වල ජලය එකතුවිය හැකි ස්ථාන වලත් උන්ගේ බෝවීම සිදුවේ.

## මදුරු මර්ධන වැඩ සටහන

3. නිවසේ සහ පරිසරයේ, වහල උඩ, බැල්කනිවල, වතුර වලවල්, වාහන නවත්වන තැන් වල සහ ගෙවත්තේ මදුරුවන් පැතිරීම සීමා කිරීමට පවුලේ සියලු දෙනාගේම සහභාගී වීම අත්‍යාවශ්‍යය.

## අරමුණ

4. මදුරු මර්ධන වැඩපිළිවෙලින් පහත සඳහන් අරමුණු මුදුන් පත් කරගැනීමට පලාපොරොත්තු වේ.

I) නිවෙස් වල සහ පරිසරයේ මදුරුවන් පැතිරීම වලක්වා ලීමට සහ සීමා කිරීමට පවුලේ සෑම සාමාජිකයකුම උනන්දු කිරීම.

II) සෑම ආකාරයකම මදුරුවන් පැතිරිය හැකි ස්ථාන විනාශ කිරීම.

III) පවුලේ සෑම සාමාජිකයකුටම මදුරුවන් පාලනය කිරීමේ වැදගත්කම සහ ඩෙංගු උණ පිළිබඳව සැලකිලිමත් වීමටත් මතක් කර දීම.

## මර්ධනය කිරීමේ ක්‍රමය

5. මදුරු බිත්තර වලින් පරිනත මදුරුවකු සෑදීමට දින 7ක් ගත වන බැවින්, මදුරුවන් පැතිරිය හැකි ස්ථාන සෑම සතියකට වරක් පරීක්ෂා කළ යුතුය.

## මදුරුවන් බෝවීම වැලැක්වීම සහ පාලනය කිරීම

6. සාමාන්‍යයෙන් මදුරුවන් පැතිරෙන ස්ථාන සහ ඒවා ඉවත් කල හැකි ක්‍රම:

### I. නිවස තුල

| පැතිරෙන ස්ථාන | ගැටළුවට හේතුව | පාලනය කල යුතු ක්‍රමය | සටහන් |
|---|---|---|---|
| මල් බඳුන් | මල් බඳුන් තුල ජලය තිබීම මදුරුවන් පැතිරෙන ස්ථාන සලසයි. | අඩු වශයෙන් සතියකට වරක් වතුර මාරු කරන්න. බඳුනේ ඇතුලත සුද්ද කරන්න. | |
| මල් පෝච්චි පතුලේ තබන පිරිසි | වැඩි වතුර, පිරිසි වල එකතු වීම සිදුවේ. | වතුර සැපයීමෙන් පසුව ඉක්මනින් වැඩිපුර වතුර ඉවත් කරන්න. | පෝච්චි සඳහා පිරිසි පාවිච්චි නො කරන්න |
| වායුසමීකරන පතුලේ ඇති භාජන | එම භාජන තුල වතුර එකතු විය හැක | වතුර හොඳින් බේරා හරින්න | මදුරුවන් නිරීක්ෂණය කිරීමේදී ඒවා ද පාලනය කල යුතුයි |

### II. වහලඋඩ සහ බැල්කනිවල

| පැතිරෙන ස්ථාන | ගැටළුවට හේතුව | පාලනය කල යුතු ක්‍රමය | සටහන් |
|---|---|---|---|
| මල් බඳුන් | මල් බඳුන් තුල ජලය තිබීම මදුරුවන් පැතිරෙන ස්ථාන සලසයි. | අඩු වශයෙන් සතියකට වරක් වතුර මාරු කරන්න. බඳුනේ ඇතුලත සුද්ද කරන්න. | |
| මල් පෝච්චි පතුලේ තබන පිරිසි | වැඩි වතුර පිරිසි වල එකතු වීම සිදුවේ. | වතුර සැපයීමෙන් පසුව ඉක්මනින් වැඩිපුර වතුර ඉවත් කරන්න. | පෝච්චි සඳහා පිරිසි පාවිච්චි නො කරන්න |

| | | | |
|---|---|---|---|
| ජලය ගබඩා කර ඇති භාජන | එළිමහනේ තබා ඇති භාජන වල වැහි වතුර පහසුවෙන්ම එකතු වේ. | පියනකින් වසා තබන්න. | වතුර භාජන වෙනුවට ජලනල භාවිතා කරන්න |
| වායුසමීකරන පතුලේ ඇති භාජන | එම භාජන තුල වතුර එකතු විය හැක | වතුර හොඳින් බේරා හරින්න | මදුරුවන් නිරීක්ෂණය කිරීමේදී ඒවා ද පාලනය කල යුතුයි |
| පීලි සහ ජලය බසින නල වල මතුපිට | 1. පළුදු සහිත පීලි සහ ජල නල මතුපිට පහසුවෙන්ම ජලය එකතු වේ<br><br>2. කුණු සහ කොල හිරවීම | 1. ඒවා අළුත් වැඩියා කල යුතුයි.<br><br>2. කොල සහ කුණු අඩු වශයෙන් සතියකට වරක් හෝ සුද්ද කරන්න | |

## III. වෙනත් ස්ථාන (වත්ත, වතුර වලවල්, සහ වාහන නවත්වන ස්ථාන)

| පැතිරෙන ස්ථාන | ගැටළුවට හේතුව | පාලනය කල යුතු ක්‍රමය | සටහන් |
|---|---|---|---|
| මල් බඳුන් | මල් බඳුන් තුල ජලය තිබීම මදුරුවන් පැතිරෙන ස්ථාන සලසයි. | අඩු වශයෙන් සතියකට වරක් වතුර මාරු කරන්න. බඳුනේ ඇතුලත සුද්ද කරන්න. | |
| මල් පෝච්චි පතුලේ තබන පිරිසි | වැඩි වතුර පිරිසි වල එකතු වීම සිදුවේ. | වතුර සැපයීමෙන් පසුව ඉක්මනින් වැඩිපුර වතුර ඉවත් කරන්න. | පෝච්චි සඳහා පිරිසි පාවිච්චි නො කරන්න |
| අනවශ්‍ය ද්‍රව්‍ය, විශේෂයෙන්ම ටින් සහ බෝතල් | ඒවායේ ජලය පහසුවෙන්ම එකතු වේ | එම ද්‍රව්‍ය කුණු බෑගයක දමා, ගැට ගසා, පියන සහිත භාජනයකට දමා වසා තබන්න | |
| ජලය ගබඩා කර ඇති භාජන | එළිමහනේ තබා ඇති භාජන වල වැහි වතුර පහසුවෙන්ම එකතු වේ. | පියනකින් වසා තබන්න. | වතුර භාජන වෙනුවට ජලනල භාවිතා කරන්න |

| | | | |
|---|---|---|---|
| ගස් බෙන, උන ගස් වල කැඩී ඉතිරි කොටස් | ස්වාභාවික වතුර එකතු වේ. | වතුර ඉවත්කර වැලි, මඩ හෝ සිමෙන්ති වලින් පුරවන්න | |
| වාහන නො වදින සේ පාවිච්චි කරන පරණ ටයර් | වැසි වතුර හා කාර් සෝදන විට එම ටයර් වල වතුර රැඳිය හැක | ටයර් වල පතුලේ විශාල සිදුරු සාදන්න | ටයර් වෙනුවට පොලවේ ලකුණු කිරීම වඩා සුදුසුය |
| ජලනල මතුපිට | 1. පළුදු වූ ජලනල මතුපිට වතුර රැඳිය හැක.<br>2. කුණු හෝ කොල හිර විය හැක | 1. ඒවා අළුත් වැඩියා කල යුතුයි<br><br>2. අඩු වශයෙන් සතියකට වරක් එම කුණු සහ කොල සුද්ද කරන්න | |
| පොකුණු | ගලා නොයන ජලයේ මදුරුවන්ගේ බෝවීම සිදුවේ | මදුරු පිළවි ආහාරයට ගන්නා මාළු ඇති කිරීම | |

7. පරිණත මදුරුවෝ නිවසේදී හමුවුවහොත් නිවෙස් වල භාවිතා කරන කෘමි නාශක වලින් ඔවුන් විනාශ කල හැක.

8. මදුරුවන් පැතිරීමට මූලික වූ හෝ පැතිරිය හැකි ප්‍රදේශ සතියක් තුල විනාශ කල නො හැකි නම් පමනක් මදුරු පිළවි විනාශ කල යුතුය

## ක්‍රියා මාර්ග

9 මදුරුවන්ගෙන් වැලකීමට ක්‍රියා කිරීම සඳහා, මදුරුවන් බෝවන ස්ථාන ඒ සඳහා ගත් ක්‍රියා මාර්ග සඳහන් කිරීමට වැඩ සටහනක් සෑදීමෙන් ඉහත පරිජේද 6 හි සඳහන් කල පරිදි එහි සඳහන් කල හැක.

10. මදුරුවන් පාලනය සහ වැලකීම සඳහා උන් විනාශ කරන ආයතන පත් කල හැක. මදුරුවන් වැලැක්වීම සම්බන්ධව උපදෙස් ආහාර සහ පරිසර සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.